**ශ්‍රී ලංකාවේ සුනාමියෙන් පසු නැගෙනහිර පළාතේ සහභාගීත්ව වෙරළ කලාප ස්ථාපිත කිරීම හා තිරසාර කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

-----------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකාවේ සුනාමියෙන් පසු නැගෙනහිර පළාතේ සහභාගීත්ව වෙරළ කලාප ස්ථාපිත කිරීම හා තිරසාර කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල අතර 2009 ජූලි 23 දින එළඹි අංක ජීර්එෆ්-එෆ්එස්පී-5-එල්කේ දරන ප්‍රදාන ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කෙසේ වෙතත්, 2012 අප්‍රේල් 04 දින ප්‍රදාන ගිවිසුමට සිදු කළ සංශෝධනයන්ට අනුව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතියේ නව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විය. වර්තමානයේ මෙම ක්ෂේත්‍රයේ කටයුතු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත මාරු කර තිබුණි. තිරසාර ජීවන රටාවට සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ දේශගුණ වෙනස්වීමේ අනතුරට භාජනය වීම අඩුකිරීමට උපකාරී වන යළි ඉදිකිරීමේ ක්‍රියාවලියකින් සුනාමියෙන් බලපෑමට ලක්වූ ගෝලීය වශයෙන් වැදගත් පරිසර පද්ධතියෙහි ප්‍රධාන ප්‍රවාහය ස්ථාපිත කිරීම සහ කළමනාකරණ සංරක්ෂණය ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ගෝලීය පාරිසරික පහසුකමේ මූල්‍යායනය කිරීම් එ.ජ.ඩො. මිලියන 7.27 ක්ද, ශ්‍රී ලංකා රජය මඟින් එ.ජ.ඩො. 430,300 ක දායකත්වයක්ද, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල මඟින් එ.ජ.ඩො 7,083,650 ක් හා ලෝක සංරක්ෂණ සංගමය මඟින් එ.ජ.ඩො. 55,500 ක් සමඟ එ.ජ.ඩො. මිලියන 7.57 ක සමමූල්‍යායනය කිරීමෙන් සමන්විත වන ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 14.84 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 10 ආරම්භ කළ අතර 2015 සැප්තැම්බර් 10 අවසන් කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාලය 2016 සැප්තැම්බර් 10 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම

විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ දායකත්ව නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

2014 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 18,217,174 ක්වූ කෙරීගෙන යන වැඩවල අගය සම්පූර්ණ කළ වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යායනය,සමාලෝචිත වර්ෂය තුළදි හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. (මිලියන) | රු.(මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු.(මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු.(මිලියන) |
| කෘ.සං.ජා.අ | 14.41 | 1,929.10 | 1.33 | 174.19 | 2.61 | 374.06 |
| ශ්‍රී.ලං.ර | 0.43 | 55.90 | 0.04 | 5.62 | 0.11 | 14.70 |
| එකතුව | 14.84 | 1,985.00 | 1.37 | 179.81 | 2.72 | 388.76 |

මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් සකස් කළ වැඩ සැලැස්ම අනුව, 2010 සිට 2014 දක්වා කාලපරිච්ජේදය තුළ සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු. මිලියන 920.97 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 388.76 ක් එනම් සියයට 42 ක් පමණක් 2014 වර්ෂය අවසානය දක්වා භාවිතා කර තිබුණි.

(ආ) උප ක්‍රියාකාරකම් 03 ක් යටතේ ක්‍රියාකාරකම් 12 ක් ක්‍රියාත්මක කිරීමට 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදිත රු. මිලියන 32.55 න් කිසිවක් සම්පූර්ණයෙන්ම භාවිතා කර නොතිබුණි. තවද පරිසර පද්ධතිය ප්‍රතිස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකය වන අතර එම සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 4.10 කට සමාන රු. මිලියන 528.66 ක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් එයින් රු. මිලියන 151 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දක්වා වියදම් කර තිබුණි. කෙසේ වෙතත් වාහන හා උපකරණ ප්‍රසම්පාදනය සඳහා දරණ ලද පිරිවැය මුළු ප්‍රතිපාදනයට වඩා සියයට 21 කින් වැඩි වී තිබුණි.

(ඇ) සමස්ථයක් ලෙස, ව්‍යාපෘතියේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් වෙනුවෙන් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලින් වෙන් කළ එ.ජ.ඩො. මිලියන 14.41 න් 2014 දෙසැම්බර් 31 දිනට වසර 06 ක් අවසන් වන විටත් එ.ජ.ඩො. මිලියන 2.61 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

තාක්ෂණික සහායයන්, පරිසර පද්ධති ප්‍රතිස්ථාපිත කිරීම සහ පරිසර පද්ධතිය අනතුරට භාජනය වීම අවම කිරීම සහ දැඩි දේශගුණික වෙනස් වීම් සඳහා ප්‍රජාවන් අනුකූල කිරීමේ වැඩ සටහන් වැනි ප්‍රධාන සංරචක යටතේ ව්‍යාපෘති ප්‍රදානයන් ප්‍රතිපාදනය කර තිබුණි. තවද උප ක්‍රියාකාරකම් 71 ක් සිදු කිරීමට අපේක්ෂිත වූ අතර එයින් උප ක්‍රියාකාරකම් 61 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර තිබුණි. ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා වාර්ෂික වැඩ සැලැස්ම අනුව, පරිසර පද්ධති ප්‍රතිස්ථාපිත කිරීම සහ අනුකූල කිරීමේ වැඩ සටහන යටතේ දැනුවත් බව ඇති කිරීම සඳහා ප්‍රදර්ශන පුවරු 150 ක් එසවීමට රු. මිලියන 6.00 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වෙතත් අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ප්‍රදර්ශන පුවරු 35 ක් පමණක් එසවීමට එකතුව රු. මිලියන 1.40 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි.

(ආ) පරිසර පද්ධති ප්‍රතිස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ පරිසර පද්ධතියට අනුකූල කිරීමේ හා ස්ථාපිත කිරීමේ ඒකක වෙත මාර්ගෝපදේශයන් සකස් කිරීමට සහ පහසුකම් සැපයීමට එකතුව රු. මිලියන 11.50 ක් වාර්ෂික වැඩ සැලැස්මේ ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එවැනි වැඩ ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් ඉහත වැඩ සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තාවේ සම්පූර්ණ කළ වැඩ ලෙස දක්වා තිබුණි.

(ඇ) රු. මිලියන 22.04 ක පිරිවැයකට නිලාවෙලිහි අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සංවර්ධනය කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය කුච්චවෙලි ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, 2015 අප්‍රේල් 14 ට පෙර කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ වැඩ අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, ආරක්ෂක කාමරය, පොහොර ගබඩාව, විවේකාගාරය සහ වැසිකිළි ආදිය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදිත රු. මිලියන 11.90 ක වැඩ 2015 ජූනි 30 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ii) තීන්ත දෙවතාවක් ආලේප කර නොමැති වුවත්, පැස්සුම් වලට නිරාවරණය වූ තැන් මල නොබැඳෙන තීන්ත හා එනමල් තීන්ත දෙවතාවක් ආලේප කිරීම මඟින් පරිශ්‍රය වටා ජීඅයි බට වල දම්වැල් සම්බන්ධ කම්බි දැල් එසවීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත සමස්ථ කොන්ත්‍රාත් වටිනාකම වූ රු. 561,600 ක් ගෙවා තිබුණි.